සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 07 | විෂයය / பாடம் / Subject බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I ,II | කාලය / காலம் / Time පැය 02යි. |

නම : ................................................................................ විභාග අංකය : .............................................

# I කොටස

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම සුදුසු නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(1) බුදුන් හා දහම් සරණ ගිය පළමු ද්වේවාචික උපාසකවරුන් වන්නේ,

1. පිප්ඵලී, සච්චක දෙදෙනා ය.
2. තපස්සු, භල්ලුක දෙදෙනා ය.
3. උපතිස්ස, කෝලිත දෙදෙනා ය.
4. සුනීත, සෝපාක දෙදෙනා ය.

(2) බුදුරජාණන් වහන්සේ ලෝකයේ ඇති අතීත, වර්තමාන, අනාගත යන තුන්කාලයටම අයත් සියලු දේ අත්ලෙහි වූ නෙල්ලි ගෙඩියක් මෙන් මනාව දත් හෙයින්,

1. අරහං නම් වන සේක.
2. සම්මා සම්බුද්ධ නම් වන සේක.
3. ලෝකවිදූ නම් වන සේක.
4. අනුත්තර නම් වන සේක.

(3) තැනින් තැන ගෙන් ගෙට
ගොසින් බලමින් වට පිට
.................................................................................
ලොබින් නොයිදින් නැතත් කෑමට

සිරිත් මල්දමේ සඳහන් වන ඉහත කවියේ හිස්තැනට සුදුසු පද්‍ය පාඨය වන්නේ,

1. උස් හඬින් කතා කොට
2. උදහසින් බලන විට
3. අනුන් කන බොන විට
4. ඉක්මණින් ගොස් එතැනට

(4) පිරුවානා පොත් වහන්සේ තුළ ඇතුළත් තුන් සූත්‍රය වන්නේ,

1. මහා මංගල සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය හා පරාභව සූත්‍රය යි.
2. රතන සූත්‍රය, අනත්තලක්ඛණ සූත්‍රය හා කරණීයමෙත්ත සූත්‍රය යි.
3. කරණීයමෙත්ත සූත්‍රය, ධම්මචක්කප්පවත්තන සූත්‍රය හා රතන සූත්‍රය යි.
4. මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය හා කරණීයමෙත්ත සූත්‍රය යි.

(5) කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් 'භූතා' යනු ,

1. උපන් සත්වයෝ ය.
2. නූපන් සත්වයෝ ය.
3. ඇසට පෙනෙන සත්වයෝ ය.
4. ඇසට නොපෙනෙන සත්වයෝ ය.

(6) බුදු සසුනේ අග්‍ර දායිකාව වන්නේ,

1. යශෝධරා දේවිය යි.
2. විශාඛා උපාසිකාව යි.
3. මහා ප්‍රජාපතී ගෝතමී දේවිය යි.
4. සාමාවතී බිසවයි.

(7) බෞද්ධයාගේ අත්පොත වන ධම්මපදය ග්‍රන්ථයේ ඇතුළත් ගාථා ගණන වන්නේ,

1. 465 කි.
2. 455 කි.
3. 423 කි.
4. 550 කි.

(8) ගුරු සිත නොරිදවා - වේලාව නොවරදවා
බැති පෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා
ඉහත කවිය ඇතුළත් වන්නේ,

1. ලෝවැඩ සඟරාවේ ය.
2. සුභාෂිතයේ ය.
3. සිරිත් මල්දමෙහි ය.
4. කාව්‍යශේඛරයේ ය.

(9) 'පුණ්ණ' නම් ශ්‍රාවක ස්වාමීන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි උතුම් ආදර්ශය වන්නේ,

1. උත්සාහය යි.
2. කළගුණ සැලකීම යි.
3. ඉවසීම යි.
4. පරාර්ථචර්යාව යි.

(10) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දක්වෙන 'සම්මා සති' යනු,

1. යහපත් උත්සාහය යි.
2. යහපත් වචනය යි.
3. යහපත් දැකීම යි.
4. යහපත් සිහිය යි.

(11) ත්‍රිවිධ ශික්ෂාව ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,

1. සීල, සමාධි, ප්‍රඥා
2. දාන, සීල, භාවනා
3. මෙත්තා, කරුණා, මුදිතා
4. දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව

(12) අත්තූපනායික ධර්මය යනු,

1. පරාර්ථචර්යාවේ යෙදීමයි.
2. තමා උපමා කොට ගෙන වැරදිවලින් මිදීමයි.
3. අනුන්ට වඩා තමා ගැන සිතා කටයුතු කිරීමයි
4. වැරදි වලින් මිදීමට පෙර වැරදි සිහි කිරීමයි.

(13) උදුම්බරඛාදකයින් ලෙස බුදු දහමෙහි හඳුන්වා ඇත්තේ,

1. කිසිම දෙයකට වැය නොකර උපයන සියල්ල ළඟ තබා ගන්නා අයයි.
2. ආදායමින් කොටසක් පමණක් වැය කරන අයයි.
3. උපයන සියල්ල වැය කරන අයයි.
4. කොටසක් තමා ළඟ තබා ගෙන ඉතිරිය වැය කරන අයයි.

(14) 'විභාගය අසමත් වූ ශිෂ්‍යයා වස බී දිවි නසා ගනී' යනුවෙන් පුවත්පතක ශීර්ෂ පාඨයක් තිබුණි. එසේ වීමට හේතුව ලෙස සැලකිය හැක්කේ,

1. විභාගය හොඳින් ලිවීමට අපහසු වූ නිසයි.
2. ක්‍රෝධය පාලනය කර ගත නොහැකි වීම හා ඉවසීම නැති කමයි.
3. සිතූ තරම් ප්‍රතිඵලයක් නොතිබූ නිසා දෙමව්පියන් දොස් නැගූ නිසයි.
4. විභාගයෙන් ජය ලැබීමට ඔහුට පාඩම් කිරීමට නොහැකි වූ නිසයි.

(15) කාන්තාරයක ගමන් කළ වෙළඳ කණ්ඩායම් දෙකක් ගැන ඔබ අසා ඇත. එම කතා පුවත සඳහන් වන්නේ,

1. අපණ්ණක ජාතකයේ ය.
2. තිලමුට්ඨි ජාතකයේ ය.
3. සස ජාතකයේ ය.
4. උම්මග්ග ජාතකයේ ය.

(16) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ,

1. දස සීලයයි.
2. ආජීව අෂ්ටමක සීලයයි.
3. ප්‍රව්‍රජික සීලයයි.
4. පංච සීලයයි.

(17) බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව වන්නේ,

1. වේළුවනාරාමයයි.
2. ජේතවනාරාමයයි.
3. පූර්වාරාමයයි.
4. ඝෝෂිකාරාමයයි.

(18) අනපේක්ෂිත අයුරින් විපත් රැසකට මුහුණ දී පසුව බුදුරදුන්ගේ පිහිට ලැබූ කාන්තාව වන්නේ,

1. කිසාගෝතමී ය.
2. පටාචාරා ය.
3. මාගන්ධියා බැමිණිය යි.
4. සාමාවතී බිසවයි.

(19) මහා සුභද්‍රා, චූල සුභද්‍රා හා සුමනා යනු,

1. බිම්බිසාර රජතුමාගේ දියණියන් ය.
2. කොසොල් රජතුමාගේ දියණියන් ය.
3. අනේපිඬු සිටුතුමාගේ දියණියන් ය.
4. ධර්මාශෝක රජතුමාගේ දියණියන් ය.

(20) ඒකංගදස්සී චින්තකයන් ලෙස හඳුන්වන්නේ,

1. සෑම අංශයකින්ම සිතා බලා අදහස් දක්වන්නන් ය.
2. එක් පැත්තකින් පමණක් අදහස් දක්වන්නන් ය.
3. මෙලොව පරලොව දෙක පමණක් ගැන අදහස් දක්වන්නන් ය.
4. තමා ගැන පමණක් සිතා අදහස් දක්වන්නන් ය.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනිකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වෙයි.

(01) පාසල් පාදක ඇගයීම් වැඩසටහන යටතේ ඔබ විසින් තෙවන පාසල් වාරයේ පන්ති කාමරයේ දී සිදු කරන ලද ස්ව නිර්මාණ සංග්‍රහය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ විසින් සකස් කරන ලද ස්ව නිර්මාණ සංග්‍රහය සඳහා යොදා ගත් පාඩම කුමක් ද? (ල. 2)

(ii) එය සකස් කිරීම සඳහා ගුරුතුමා / ගුරුතුමිය ඔබට දුන් උපදෙස් 02 ක් ලියන්න. (ල. 2)

(iii) නිර්මාණ සංග්‍රහයට කරුණු සොයා ගත් මූලාශ්‍ර 02 ක් ලියන්න. (ල. 2)

(iv) බුදු දහම අනුව අප අනුන් හා පවත්වන කතාබස්වල දෙයාකාරය නම් කරන්න. (ල. 4)

(v) මජ්ඣිම නිකායේ අභයරාජ සූත්‍රයේ සඳහන් වන පරිදි අප කතා කරන වචනවල ඇතුළත් විය යුතු ප්‍රධාන අංග තුනකි. ඉන් 02 ක් ලියන්න. (ල. 2)

(vi) ඔබ නිර්මාණ සංග්‍රහයට ඇතුළත් කළ වර්තමානයේ භාවිත වන විශේෂ ශාසනික ව්‍යවහාර 02 ක් අර්ථය ද සමඟ ලියා දක්වන්න. (ල. 4)

(vii) නිර්මාණ සංග්‍රහය සකස් කිරීමේ දී ඔබට මුහුණ පෑමට සිදු වූ ගැටළු 02 ක් ලියන්න. (ල. 2)

(viii) නිර්මාණ සංග්‍රහය සකස් කිරීමෙන් ඔබ ලැබූ අත්දැකීම් 02 ක් ලියන්න. (ල. 2)

(02) (i) මිහිඳු මාහිමියන් හඳුන්වා දුන් බුදු දහමත් සමඟ මෙරට ජන සමාජය යොමු වූ උතුම් චාරිත්‍ර 02 ක් ලියන්න. (ල. 2)

(ii) ඉන් එක් චාරිත්‍රයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 3)

(iii) භික්ෂූන් වහන්සේලාගෙන් ඉටුවන සේවාවන් 05 ක් ලියන්න. (ල. 5)

(03) (i) 'සහජීවනය' යනු කුමක් ද? (ල. 2)

(ii) සහජීවනයෙන් කටයුතු කළ හැකි අවස්ථා 03 ක් ලියන්න. (ල. 3)

(iii) පාසල තුළ හා සමාජය තුළ ආගම් භේදයකින් තොරව ඔබ කටයුතු කරන ආකාරය පේළි 05 කින් පමණ විස්තර කරන්න. (ල. 5)

(04) (i) පංච නියාම ධර්මවලින් 02 ක් ලියන්න. (ල. 2)

(ii) ඉන් එකක් හඳුන්වන්න. (ල. 3)

(iii) සියල්ල සිදු වන්නේ කර්මයේ බලයෙන් නොවන බවට උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 5)

(05) (i) චතුරාර්ය සත්‍යයේ මුල් සත්‍ය දෙක ලියන්න. (ල. 2)

(ii) තෘෂ්ණාවේ ප්‍රභේද තුන ලියන්න. (ල. 3)

(iii) චතුරාර්ය සත්‍යය ඉගෙන ගැනීමෙන් ඇති ප්‍රයෝජන මොනවාද? (ල. 5)

(06) (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස............. යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 2)

(ii) එහි අර්ථය ලියන්න. (ල. 3)

(iii) මෙම ගාථාවට අනුව ඔබ කටයුතු කරන අයුරු පැහැදිලි කරන්න. (ල. 5)

(07) (i) මහින්දාගමනය යනු කුමක් ද? (ල. 2)

(ii) ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න. (ල. 3)

(iii) මහින්දාගමනයෙන් අප ලත් දායාද 05 ක් ලියන්න. (ල. 5)